
# 21. මීරියම්

**දේව විශ්වාසය මත ජයාන්විත ව නපුර ඉවත් කළ දාවිත්ගේ නිර්භීත ක්‍රියාවලිය අප ජීවිතවලට ආදර්ශයක් ලබා දුන් ආකාරය පෙර පාඩම් තුළින් උකහා ගත්තෙමු. අද අප යොමු වන්නේ මිසරයේ විසූ ඉශ්‍රායෙල් පවුලක් පීඩාවකට මැදි වූ අවස්ථාවක දී එම පවුලේ දියණිය ක්‍රියාකාරී වෙමින් ධෛර්යවත් ව එම තත්වයට මුහුණ දුන් ආකාරය අධ්‍යයනය කිරීමට ය. ඒ මගින් පවුල තුළ ජීවත් වීමේ දී අපගේ වගකීම් වටහා ගැනීමට ආලෝකයක් ලැබෙනු නිසැක ය.**

පැරණි ගිවිසුම් යුගයේ සාගතයකට මුහුණ දුන් ආදී පීතෘ ජාකොබ්ගේ පවුල ඉන් මිදීමට මිසරයට ( ඊජිප්තුව) ගොස් පදිංචි වූහ. එහි ගත කළ කාලය තුළ මෙම පවුල ගණනින් වැඩි වර්ධනය විය. මිසර රජතුමා වූ පාරාවෝ ඉශ්‍රායෙල් ජන සංඛ්‍යාව වර්ධනය වීම මර්ධනය කිරීමට විවිධ අන්දමට උපක්‍රම යෙදී ය. එහෙත් කිසිවක් සාර්ථක නොවී ය. වඩ වඩා ජනගහන වර්ධනය සිදු විය. එවිට රජතුමා දරුණු නීතියක් නිකුත් කර, ඉශ්‍රායෙල් පවුල්වලට උපදින පිරිමි දරුවන් නයිල් ගඟට විසි කළ යුතු බව අණ කළේ ය. ඉශ්‍රායෙල් ජනතාවට මිසරයේ දී ව්‍යවහාර කළේ හෙබ්‍රෙව් යන නාමය ය.

මිසරයේ පදිංචි වී සිටි ලෙවී ගෝත්‍රයට අයත් අම්රම් හා ජොකෙබෙද් යුවලට මුල දී දරුවන් දෙදෙනෙක් සිටිය හ. වැඩිමල් පුත්‍රයා හා දියණියගේ නාම ආරොන් හා මීරියම් විය. මේ කාලයේ දී මෙම පවුලට තෙවන දරුවා ද එක් විය. හේ පිරිමි බිළිඳෙකි. දැන් මෙම පවුල ඉදිරියේ බැරෑරුම් ගැටළුවක් මතු විය. එනම් පාරාවෝගෙන් මේ පුංචි බිළිඳාගේ ජීවිතය රැක ගැනීම ය.

**පවුල ක්‍රියා කළ ආකාරය අපි බලමු.**




ජොකෙබෙද්: බලන්න මීරියම් දුව. චූටි මල්ලි ටිකන් ටික ලොකු වෙනවා අඬන ශබ්දය වැඩි වෙනවා. තවදුරටත් බබා ව සඟවා ගන්න අමාරු වෙනවා. හේවායන් ආවොත් අපි මොකද කරන්නේ ?

මීරියම්: අම්මේ අපි කොහොමද චූටි මල්ලි ව බේර ගන්නේ ? තාත්තේ අපිට බල බලා ඉන්න බැහැ. මල්ලි අඬනවා පිටතට ඇහුණොත් හේවායන් ඇවිත් මල්ලි ව උදුරගෙන යයි.

ජොකෙබෙද්: අපි පන් ගස් ගෙනත් කූඩයක් සාදා මල්ලි ව එහි තබා ගං ඉවුරේ තබමු. මල්ලි ඇඬුවත් කාටවත් ඇසෙන්නේ නැහැනේ.

මීරියම්: අපි අම්මා කියපු හැටියට කරමු. මම දුවලා ගිහින් පන් ගස් ගෙනෙන්නම්.

තම සහෝදරයාට තිබූ ආදරය නිසා අයියා හා අක්කා ක්‍රියා කිරීම



21:1 රූපය - මීරියම් පන් ගස් රැගෙන ඒම

ජොකෙබෙද් පන් ගස්වලින් කූඩය සාදන්නට පටන් ගත් විට පියා ද ආරොන් හා මීරියම් ද දුව පනිමින් අවශ්‍ය දේ ගෙනැවිත් දුන්නෝය.

මීරියම්: මෙන්න අම්මේ අපි පන් ගස් ගොඩක් ගෙනාවා.

ජොකෙබෙද්: දැන් පෙට්ටිය ලෑස්තියි. දෙදෙනා ම උදව් කළ නිසා තමයි ඉක්මනට පන් පෙට්ටිය හැදුණේ.

බිළිඳු මල්ලිට ඇති ආදරය නිසා පෙට්ටිය ආරක්ෂා සහිත ව සැකසුවා.

මීරියම්: අපි මල්ලිට කිරි දීලා පෙට්ටියේ තබමු.

ජොකෙබෙද්: දැන්ම බැහැ. මෙය ගං ඉවුරේ තැබුවා ම සිදුරුවලින් වතුර එනවා .ඒ නිසා කීල් හා මැලියම් තවරන්න ඕනෑ.

(මීරියම් හා ආරොන් දුව ගොස් එම ද්‍රව්‍ය ගෙනවිත්, පෙට්ටිය අඩියේ තවරා සිදුරු වැසී ය.)

ජොකෙබෙද්: දුවේ දැන් මල්ලි ව මේ පෙට්ටියේ තබා ගං ඉවුරේ තියමු.

සහෝදර ප්‍රේමය නිසා මීරියම් ධෛර්යයෙන් මල්ලි ව සුරැකීමට ඉදිරිපත් වීම.

මීරියම්: අම්මේ. මම බට පඳුර අතරේ හැංගී මල්ලි ව බලා ගන්නම්.



21:2 රූපය - මීරියම් මල්ලී ව සඟවා රැක බලා ගනිමින්

(මීරියම් මෙලෙස බලා සිටිය දී සිදු වූයේ මහා පුදුමයකි. ගංගාවේ දිය නෑමට පැමිණියේ පාරාවෝ රජුගේ දියණිය යි. රජ කුමරිය දිය නාද්දී ඇයගේ සේවිකාවෝ ඉවුර එහා මෙහා ඇවිදිමින් සිටිය හ. කුමාරිකාව පං පෙට්ටිය දැක එය ගෙන එන්නට සේවිකාවක් යැවී ය.

කුමරිය හඳුනාගත් මීරියම්, බලා සිට ඇයගේ සිතට ධෛර්යය ගත්තා ය.

කුමාරිකාව: අනේ ලස්සන හෙබ්‍රෙව් බිළිඳෙක්නේ. එයා අඬනවා. බඩගිනි ඇති. ඉතිං කවුද මේ දරු පැටියාට කිරි දෙන්නේ මට ඕනෑ මේ බබා ව හදා ගන්න.

සැඟවී සිටි මීරියම් එඩිතර ව කුමරිය වෙත පැමිණියා ය.

මීරියම්: කුමරියනි, මම ගිහින් කිරි මවක් එක්කරගෙන එන්න ද?

කුමරිය: අනේ එය නම් ලොකු උපකාරයක්

මීරියම්: මම දුවලා ගිහින් කිරි මවක් කැඳවාගෙන එන්නම්.

මීරියම් තමාගේ මල්ලීට පෝෂණය ලබා දීමට ආදරයෙන් ක්ෂණික ව ඉදිරිපත් වූවා ය.

කුමරිය: ඔබට බොහොම ස්තුතියි. කිරි මවක රැගෙන ආවාට. අම්මේ, මේ දරුවාට කිරි දී හදා වඩා ටිකක් ලොකු වුනාම මගේ මාළිගයට ගෙනවිත් දෙන්න.

ජොකෙබෙද්: හොඳයි කුමරියනි. ඔබතුමියගේ ඉල්ලීම මා නොවරදවා ඉටු කරන්නම්.

කුමරිය: මම මේ චූටි පුතාට "මෝසෙස්" කියා නම දෙනවා. එහි අර්ථය ඔහු ව වතුරෙන් ගොඩ ගත් බව සිහි කිරීමට යි.

මීරියම්ගේ සහෝදර ප්‍රේමය පුදුමාකාර ය. ඇයගේ ධෛර්යය හා වැයවීම අනගි ය. තම මල්ලී ව කෲර මරණයෙන් ආරක්ෂා කරගෙන, ඔහු ව ජීවත් කරවීමට මීරියම් ක්‍රියා කළ ආකාරය අපටත් උතුම් ආදර්ශයකි.

මෙලෙස නිරතුරු ව දේව ආරක්ෂාව තුළ හැදුණු වැඩුණු මෝසෙස්, දේව සැලසුම අනුව පසු කාලයේ දී මිසරයේ වහල් බැම්ම තුළ පීඩා විඳි ඉශ්‍රායෙල් ජනතාව මුදවා ගැනීමට නායකත්වය ගත්තේ ය. ඒ දේව කැඳවීම අනුව විය.

මෙම පාඩමෙන් අපට හමු වූ දිරිය දැරිය සැම කිතුනු දැරියකට ම ආදර්ශයකි. අප අයත් පවුල්වල සහෝදර ප්‍රේමය සුහදතාවයෙන් වර්ධනය කළ යුතු වේ. දෙමව්පියන්ට, සහෝදර සහෝදරියන්ට උපකාර කරමින්, ඔවුන් ව අගය කරමින් අවස්ථානෝචිත ව ඔවුන් වෙනුවෙන් කැප වී වැය විය යුතු වේ. දිරිය මීරියම්ගේ ආදර්ශය අනුව දේව ගරු බිය ඇතිව ජීවත් වන්න දේව පිහිට පතන්න.

**කටපාඩම් කරමු.**
**නික්මයාම 2:10**

ක්‍රියාකාරකම:

1. මීරියම් තම සහෝදරයා රැක ගැනීමට ගත් පියවර ලියන්න.
2. ඔබගේ නිවසේ දී සහෝදර සහෝදරියන්ගේ යහපත උදෙසා ඉටු කළ හැකි ක්‍රියා මාර්ග 5ක් ලියන්න.